# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2113/53 - 2019 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2019.03.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* :4-3/1/140.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ / පරවශතාවේ විස්තර:*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 725 කළුතර දකුණ ග්‍රාම නිළධාරී කොට්ඨාස තුළ පිහිටියා වූ සර්වේයර් ජනරාල්ගේ අංක මු.පි.ක. 4708 දරන සැලැස්මේ පහත සඳහන් බිම් කැබැලි:

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: ලන්සියා වත්ත නොහොත් ඩච් සෙමටරි වරිපනම් අංක 48, 48ඒ, 48බී, 48/1, 48/2, 48/3, 48/4, 48/5, 48/6, 48/1/1ඒ, 48/1/248/1/348/1/4, 48/1/5, 48/1/6, 48/1/7, ගාලු පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය:අංක 132, දහම් මාවත, කල්දෙමුල්ල, මොරටුව පිහිටි දොරටුව පුද්ගලික ආයතනය; ප්‍රමාණය: හෙක්. 0.0242

02. **කැබලි අංක 2**

ඉඩමේ නම: ලන්සියා වත්ත නොහොත් ඩච් සෙමටරි වරිපනම් අංකය නොදනී, ගාලු පාර; විස්තරය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිලි 2ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය:අංක 132, දහම් මාවත, කල්දෙමුල්ල, මොරටුව පිහිටි දොරටුව පුද්ගලික ආයතනය; ප්‍රමාණය: හෙක්. 0.0098

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2019 අප්‍රේල් මස 03 වැනි දින පෙ.ව. 10.30 ට කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019 මාර්තු මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම්/ඉඩම පරවශතාවය ලබා ගැනීම සඳහා වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණන් බැලූ හැටිත් පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.ඉඩමට ඇති තම අයිතිය සනාථ කිරීම සඳහා අදාල ඔප්පු, ප්ලෑන හා අනෙකුත් ලියවිලි පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුය.

එස්.කේ.හේනාධීර,  
ප්‍රාදේශීය ලේකම්,  
කළුතර.

2019 පෙබරවාරි මස 16 වැනි දින,  
කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03- 1037


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.



1A - G 29606 - 17 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.